# ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
# காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்
# LAND COMMISSIONER GENERAL'S DEPARTMENT

"මිහිකත මැදුර", ඉඩම් ලේකම් කාර්යාලය, 1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
"மிஹிகத மெதுர", காணிச் செயலகம், 1200/6, இராஜமல்வத்த வீதி, பத்தரமுல்ல.
"Mihikatha Madura", Land Secretriat, 1200/6, Rajamalwatta Road, Battaramulla.

☎ 011 279 7400
Fax 011 286 4051


මගේ අංකය / எனது இல / My No } චක්‍රලේඛ අංකය : 2020/13    ඔබේ අංකය / உமது இல / Your No }    දිනය / திகதி / Date } 2020.04. 22

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්,

සියළුම පළාත් ඉඩම් කොමසාරිස්වරුන්,

ඉඩම් කොමසාරිසවරුන් / සහකාර ඉඩම් කොමසාරිස්වරුන් (අන්තර් පළාත්),

**<u>රට තුළ ඇති වී ඇති අනාරක්ෂිත තත්ත්වය හමුවේ රජයේ ඉඩම් සඳහා රජයට අය විය යුතු බදු මුදල්/හැනුම් මිලෙහි අය විය යුතු වාරික මුදල් සම්බන්ධයෙන් සහන සැලසීම.</u>**

අනපේක්ෂිත ලෙස අපගේ රටට බලපා ඇති කොවිඩ් - 19 වෛරසය හේතුවෙන් රටේ සියලුම පොදු ජනතාව ආර්ථික හා සමාජයීය පසුබෑමකට ලක්ව ඇත. ව්‍යාපාරික ප්‍රජාවට ද එම බලපෑම එසේමය. ඒ අනුව එම සියලුදෙනාගේම ආර්ථික කටයුතු නිසි පරිදි පවත්වාගෙන යාමට සහයෝගය දැක්වීම සඳහා ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් ඔවුන් වෙත සහනයන් සැලසීමේ අරමුණින් පහත ක්‍රියාමාර්ග ගන්නා ලදී.

I. වාර්ෂික බදු ලබාදී ඇති බදුකරුවන් සඳහා බදු ගෙවීමට ලබා දී ඇති කාලය 2020 මාර්තු 31 දිනෙන් අවසන් වුවද එම වාර්ෂික බදුකරුවන්ට බදු ගෙවීමේ කාලය 2020 ජූලි 01 දක්වා දීර්ඝ කරන ලෙසත්, එම දිනය දක්වා බදුගෙවන්නන්ගෙන් දඩ මුදල් අය නොකරන ලෙසත්, වාර්ෂික බදු මුදල පමණක් අයකරන ලෙසත් දන්වමි.

II. දීර්ඝකාලීන බදු අනුමැතීන් ලබාදී, භුක්තිය භාරදී, බදු ගෙවමින් සිටින බදුකරුවන් හා බදුකරයක් නිකුත් කර ඇති බදුකරුවන්ගේ වාර්ෂික බදු ගෙවීමේ දිනය 2020 මාර්තු 01 දින සිට 2020 ජූනි 01 දින දක්වා වන කාලය තුල වූ නිශ්චිත දිනයක් නම්, එම අයටද 2020 ජූලි 01 දින දක්වා බදු ගෙවීම කාලය දීර්ඝ කරන ලෙසත්, එම දිනය දක්වා බදු ගෙවන බදුකරුවන්ගෙන්ද දඩ මුදල් අය කර නොගත යුතු අතර බදු මුදල පමණක් අය කළ යුතු බව දන්වමි.

III. ඔබ විසින් භුක්තිය භාරදීම සඳහා 2020 මාර්තු 01 දින සිට 2020 ජූනි 01 දින දක්වා කාලය තුල ඇති නිශ්චිත වූ දිනකට පෙර වාර මුදල් හා බදු මුදල් ගෙවිය යුතු බවට දන්වා ඇති බදුකරුවන්ගෙන්ද දඩ මුදල් අයකර නොගන්නා ලෙසත්, ඔවුන්ට මුදල් ගෙවීමට 2020 ජූලි 01 දක්වා සහන කාලයක් ලබා දෙන ලෙසත් දන්වමි.


පරිපාලන / நிர்வாக / Admin ☎ 011 279 7479 Fax 011 287 3033 | ගිණුම් / கணக்கு / Accounts ☎ 011 287 5833 Fax 011 286 4462 | ඉඩම් I / காணி I / Land I ☎ 011 287 4025 Fax 011 288 3812 | ඉඩම් II / காணி II / Land II ☎ 011 287 5834 Fax 011 287 3110 | ඉඩම් III / காணி III / Land III ☎ 011 279 7482 Fax 011 288 3635

විද්‍යුත් තැපෑල E-mail - landcom@landcommdept.gov.lk    වෙබ් ලිපිනය இணையம் Web Address - www.lancommdept.gov.lk

IV. එසේම ගැනුම් මිල වාරික වශයෙන් ගෙවන පුද්ගලයන්ටද එම සහනය ලබාදීම කළ යුතු අතර 2020 මාර්තු 01 දින සිට 2020 ජුනි 01 දින දක්වා කාලය තුළ වාරික ගෙවීමේ දිනය යෙදී ඇත්නම්, 2020 ජූලි 01 දක්වා වාරික මුදල් ගෙවීමට අවස්ථාව ලබා දෙන ලෙසත්, එම කාලය තුල මුදල් ගෙවන්නේ නම් දඩ මුදල් අය නොකරන ලෙසත් දන්වමි.

02. ඉහත සියලුම සහනයන් 2020 ජූලි 01 දිනෙන් අවසන් වන අතර ඉන්පසුව සාමාන්‍ය රජයේ ඉඩම් නීතිරීති /රෙගුලාසි හා චක්‍රලේඛ අනුව කටයුතු කළ යුතුය. මෙම සියලුම සහන ලබාදෙනුයේ උද්ගතව ඇති අනපේක්ෂිත තත්ත්වය මත මිස බදු ගෙවීම් පැහැරහරින්නන් අභිප්‍රේරණය සඳහා නොවන බව අවධාරණය කරමි.

03. මේ සම්බන්ධව යම්කිසි ගැටළුවක් පවතින්නේ නම් අවශ්‍ය උපදෙස් සඳහා මා අමතන ලෙස කාරුණිකව දන්වන අතර ඔබ සියලුදෙනාගේම සහයෝගය නිරන්තරයෙන් ලැබෙනු ඇතැයි මා අපේක්ෂා කරමි.

ආර්.එම්.සී.එම්.හේරත්
ඉඩම් කොමසාරිස් ජනරාල්

පිටපත්:

1. ජනාධිපති ලේකම්, ජනාධිපති කාර්යාලය
2. ලේකම්, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය
3. විගණකාධිපති

කාරුණික දැනගැනීම සඳහා